Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි [முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

03 S

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2570 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026

(03) ගායන ඉතිහාසය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) බුදුරදුන්ගේ ප්‍රථම ධර්ම දේශනය නම් කොට, එය කිනම් නගරයක දී, කිනම් ශ්‍රාවක පිරිසකට දේශනා කරන ලද්දේදැයි සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි)

(ii) බුදුරදුන් දේශනා කළ පරිදි, ධර්මදූත මෙහෙයක නිබිය යුතු මූලික ලක්ෂණ තුනක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(iii) බුදුරජාණන් වහන්සේ ගැටලු විසඳීම සඳහා භාවිත කළ දේශනා ක්‍රම හතරක් නම් කොට, ඒවායෙන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 08 යි)

2. (i) බුද්ධකාලීන වජ්ජි රාජ්‍යයේ පැවති බෞද්ධ ප්‍රබෝධය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) බුදුන් දවස බුදු සසුනේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කළ රජවරුන් දෙදෙනකු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(iii) බුදු සසුන දඹදිව ශිඝ්‍රයෙන් ව්‍යාප්ත වීම සඳහා ශාස්තෘවරයකු ලෙස බුදුරදුන් තුළ පිහිටි විශේෂතා හේතු වූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

3. (i) ඒහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් මහණ උපසම්පදා ලද භයානමක් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(ii) ප්‍රාදේශික අවශ්‍යතා මත විනය නීති ප්‍රතිසංස්කරණයට ලක්වූ අවස්ථා තුනක් හඳුන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iii) ප්‍රාතිමෝක්ෂයෙහි ඇතුළත් භික්ෂූන්ට අදාළ ශික්ෂාපද වර්ග කොට ඇති ආකාරය ලියා දක්වන්න. (ලකුණු 08 යි)

4. (i) හේතුව, කාලය, මූලිකත්වය, සහභාගිත්වය, ස්ථානය සහ ප්‍රතිඵල ආදී කරුණු ඇතුළත් වන සේ තෙවන ධර්ම සංගායනාව පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(ii) ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල පිළිබඳ සටහනක් පිළියෙල කරන්න. (ලකුණු 06 යි)

(iii) ධර්ම සංගායනා පැවැත්වීමට බලපෑ හේතු හතරක් ලියා දක්වා, ඒවායෙන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

5. (i) මෞර්ය වංශයේ මුල් රජවරුවන් දෙදෙනා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(ii) අශෝක රජතුමා බෞද්ධයකු වීමේ සිද්ධිය මහාවංශයෙහි දැක්වෙන අයුරින් ඉදිරිපත් කරන්න. (ලකුණු 06 යි)

(iii) ථෙරවාදී බුදුදහමට අශෝක රජතුමාගෙන් සිදු වූ සේවය අගය කරන්න. (ලකුණු 08 යි)

[2 වැනි පිටුව බලන්න.

Past Papers Wiki

II කොටස

6. (i) බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩම කළ අවස්ථා ගණන දක්වා, එම අවස්ථා පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(ii) ධර්මදූතයකු වශයෙන් මිහිදු හිමියන් විසින් ඉටු කරන ලද කාර්යභාරය අගයන්න. (ලකුණු 06 යි)

(iii) මහින්දාගමනයෙන් පසු ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස නව මගකට යොමු වූ ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

7. (i) මහාපරිනිබ්බාන සූත්‍රයේ සඳහන් ශ්‍රද්ධාවන්ත බෞද්ධයන් විසින් දැක සංවේගය ජනිත කරවා ගත යුතු ස්ථාන හතර නම් කර, ඒවායෙන් එක් ස්ථානයක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(ii) මොග්ගලිපුත්තතිස්ස හිමියන් විසින් අශෝක රජුට දන්වන ලද බුදුරදුන්ගේ අධිෂ්ඨාන පහ ලියා දක්වා, ඒවා සඳහන්ව ඇති ග්‍රන්ථය නම් කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී මහාබෝධිය ලක්දිවට වැඩමවීමෙන් පසු ලක්දිව ඇති වූ ශාස්ත්‍රීය ප්‍රබෝධය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 08 යි)

8. (i) ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනයේ ආරම්භය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) සංඝමිත්තා තෙරණිය සමග ලක්දිවට වැඩම කළ භික්ෂුණීන් වහන්සේලා භයදෙනකු නම් කරන්න. (ලකුණු 06 යි)

(iii) ලක්දිව භික්ෂුණී ශාසනයේ පරිහානිය සිදු වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

9. (i) මහාපරිනිබ්බාන සූත්‍රයේ සඳහන් ධාතු බෙදා දීම පිළිබඳ පුවත විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) දළදා වහන්සේ වැඩමවීමට ප්‍රථමයෙන් ලක්දිව ධාතු පූජා පැවති බවට සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 06 යි)

(iii) "දළදා වහන්සේ ජාතික උරුමයකි" යන ප්‍රකාශය තහවුරු කරන්න. (ලකුණු 08 යි)

10. පහත සඳහන් මාතෘකා අතුරෙන් හතරක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (ලකුණු 05 × 4 = 20 යි)

(i) මගධ ජනපදය

(ii) ආනන්ද තෙරණුවෝ

(iii) දඹදෙණි යුගයේ දළදා මාලිගා

(iv) ජේතවන විහාරය

(v) ලිච්ඡවී රජවරු

(vi) බෞද්ධ චිත්‍ර කලාව

(vii) ථූපාරාම දාගැබ

(viii) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library